(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 72.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 පෙබරවාරි මස 09 වැනි බදාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0041/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරුන් වන ගරු ජෝන් අමරතුංග, ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ සහ ගරු රෝහිත බෝගොල්ලාගම යන මහත්වරුන් විසින් ඉදිරිපත් කරන ලද කෝප් (COPE) වාර්තා සහ 2007 ජනවාරි 12 වැනි දින ගරු විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිටපු විගණකාධිපති මායාදුන්න මහතා විසින් ඉදිරිපත් කරන ලද 2006 ජුලි 20 වැනි දිනැති වාර්තාව සහ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු රවුෆ් හකීම් මහතා විසින් 2007 නොවැම්බර් 29 වැනි දින ඉදිරිපත් කරන ලද අංක PS12 දරන වාර්තාව සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත වාර්තාවලට අනුව විමර්ශනය කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) කාරක සභා වාර්තාවේ සඳහන් උපදෙස් අනුව ආරම්භ කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0528/'10

2.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, ඇතුළත වටරවුම් මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ අධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0700/'10

3.

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධිකරණ අමාත්‍යාංශය යටතට එන නීති සහ රෙගුලාසි සඳහා කළ යුතු වෙනස්කම් නිර්දේශ කිරීම සඳහා එතුමාට පෙර එම නිලය දැරූ අමාත්‍යතුමා විසින් පත් කරන ලද කාරක සභා සංඛ්‍යාව කවරේද;

(ii) එම කාරක සභා විසින් සලකා බලන ලද අංශ කවරේද; සහ

(iii) අමාත්‍යාංශයට වාර්තා ඉදිරිපත් කර ඇති කාරක සභා සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) වාර්තා ඉදිරිපත් කර නොමැති කවර හෝ කාරක සභාවල වාර්තා කඩිනමින් ඉදිරිපත් කිරීම තහවුරු කිරීම සඳහා එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) (i) කඩිනම් තීන්දු ලබාදීම දෛර්යමත් කරන සහ යුක්තිය පසිඳලීම පමා කිරීම සඳහා වන දින ඉල්ලීම් සහ ඒ සඳහා වන එකඟත්වයන් අදෛර්යයට පත් කරන කාර්ය සාධන දර්ශක විනිශ්චයකාරවරුන් සහ මහේස්ත්‍රාත්වරුන් සඳහා ස්ථාපිත කිරීම;

(ii) සිර මැදිරිවල තදබදය සහ තරුණ පුද්ගලයන් සඳහා ලබාදෙන යෝග්‍ය නොවන දඬුවම් අඩු කිරීම සඳහා වැඩි අවබෝධයක් සහිත දඬුවම් දීමේ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම;

(iii) ගැටුම් සඳහා අධිකරණ ක්‍රියාමාර්ගවලින් පිහිට සෙවීම අඩු කිරීම සඳහා බේරුම්කරණයට සහ සමාදාන කිරීමට අදාළ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම; සහ

(iv) දඬුවම් ලබාදීම සිදු කරන්නේ අඩපාඩු සකස් කිරීමේ සහ වැළැක්වීමේ සාධකයක් ලෙස විනා පළිගැනීම අරමුණු කරගෙන නොවන බව තහවුරු කරමින් විනිශ්චයකාරවරුන්ට, මහේස්ත්‍රාත්වරුන්ට සහ පොලිස් නිලධාරීන්ට පුහුණුව ලබා දීම;

ඉහත සඳහන් වාර්තා අතරින් කිසියම් වාර්තාවක් මගින් හෝ නිර්දේශ කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම්, එම වාර්තා පදනම් කරගෙන එතුමා පියවර ගන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, මෙම අරමුණු සාර්ථක කර ගැනීම සඳහා එතුමා වෙනත් පියවර ගන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

0789/’10

4\.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) පිහිටුවා ඇති අනාථ නිවාසවල සිටින සරණාගතයන්ගේ සංඛ්‍යාව;

(ii) එම අනාථ නිවාසවල සිටින සරණාගතයන් වෙනුවෙන් රජය මඟින් සපයනු ලබන පහසුකම් හා සේවාවන්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සරණාගතයන් නැවත පදිංචිකිරීමේ කටයුතු අවසන් කිරීමට රජය ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙළ කුමක්ද;

(ii) එම නැවත පදිංචිකිරීමේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂිත දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0859/’10

5\.

ගරු අජිත් කුමාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල බස් නැවතුම්පල ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත වියදම කොපමණද;

(ii) මෙම ඇස්තමේන්තුව සකස්කළ ආයතනය කුමක්ද;

(iii) එම ඇස්තමේන්තුව හා ගොඩනැගිල්ලේ සැලැස්ම කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියට අදාළ,

(i) කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත්කරුවන් කවුරුන්ද;

(ii) උපදේශක සමාගමක් හෝ ආයතනයක් තිබේ නම්, ඒ කවරේද;

(iii) අධීක්ෂණ කටයුතු කරනු ලබන ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම බස්නැවතුම්පලේ ස්වභාවය හා අදාළ ගොඩනැගිල්ල තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ආයතන හෝ ව්‍යාපාර කවරේද;

(ii) මෙම ගොඩනැගිල්ල තුළ ව්‍යාපාරික ස්ථාන ලබාදීමේදී අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කුමක්ද;

(iii) බස්නැවතුම්පල ඉදිකිරීමට සමගාමීව බස් නැවතුම්පල අවට සහ ගාලු නගරයේ අනිකුත් ප්‍රදේශවලින් ඉවත් කරන ලද පදික වෙළඳුන්ට හා තාවකාලික ව්‍යාපාරික ස්ථාන හිමියන්ට ලබාදෙන සහනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0878/’10

6\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලෙනවර උයනේ ඉදි කළ වොලිබෝල් ක්‍රීඩාංගනය වෙනුවෙන් වැය කළ මුදල කොපමණද;

(ii) භූමිය මත ඇති වැඩිදියුණු කිරීම් තක්සේරු කිරීම අනුව එකී ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු විසින් සිදුකර ඇති වැඩ ප්‍රමාණයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය සභාව සමග ගිවිසුම් අත්සන් කළ තැනැත්තා කවුරුන්ද;

(ii) එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී යම් අක්‍රමිකතාවයක් සිදුවී තිබේද;

(iii) එසේ නම්, ඒ පිළිබඳව ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0431/’10

7\.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ කටයුතු අමාත්‍යවරයා සිය ධූරයේ රාජකාරි භාරගත් දිනයේ සිට අද දක්වා විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස විදේශ ගතවූ වාර සංඛ්‍යාව කොපමණද;

(ii) සංචාරය කළ රටේ නම, සංචාරය සඳහා හේතුව, අමාත්‍යවරයා සඳහා වියදම, කැටුව ගිය පුද්ගලයන්ගේ නම් සහ ඔවුන් වෙනුවෙන් දැරූ පිරිවැය, එක් එක් සංචාරය සඳහා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් සංචාරය තුළින් මෙරට ලැබූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ 5 තුළ, වත්මන් අමාත්‍යවරයාට පෙර එම තනතුර දැරූ පුද්ගලයන් ඉහත සඳහන් රටවලටම සංචාරය කළ වාර ගණන කොපමණද;

(ii) ඒ සඳහා වැයවූ සමස්ත පිරිවැය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0535/’10

8\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, සියඹලාණ්ඩුව - පොතුවිල් - අක්කරපත්තු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0790/'10

9.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 අගෝස්තු මස 18 වෙනි දින ඇතිවූ සුළි කුණාටු තත්වයක් හේතුවෙන් අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පරගහකැලේ ගම්මානයේ නිවාස කිහිපයකට අලාභ හානි සිදුවූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම තත්ත්වය නිසා අලාභහානි වූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිවසට සිදුව ඇති හානිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඊට අඅාළව රජය මගින් ලබා දී ඇති සහන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඒ වෙනුවෙන් රජය වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0860/'10

10.

ගරු අජිත් කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් සිසුන්ට ආහාර සැපයීමේ වැඩසටහනක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන්නේද;

(ii) එම වැඩසටහන ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම්, දිස්ත්‍රික්ක සහ අධ්‍යාපන කලාප මට්ටමෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා අරමුදල් ලබාදෙන දේශීය හෝ විදේශීය ආයතන කවරේද;

(iv) මෙම වැඩසටහන අනුව එක් සිසුවෙකුට දිනකට වෙන්කරනු ලබන මුදල හා ලබාදෙන ආහාර වේල කවරේද;

(v) මෙම වැඩසටහන පාසල් මට්ටමින් ක්‍රියාත්මකවන ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන යටතේ පාසල් සඳහා ආහාර සපයන අධ්‍යාපන කලාප ගණනාවකම ආහාර සැපයුම්කරුවන්ට නියමිත පරිදි මුදල් ගෙවා නොමැති බවත්;

(ii) ආහාර සැපයුම්කරුවන්ට මුදල් ගෙවීම ප්‍රමාද කිරීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුව ඇති බවත් හා එමඟින් පාසල් සිසුන්ට ආහාර ලබාදීමේ වැඩසටහනට බාධා වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත ආහාර සැපයුම්කරුවන්ට අවසාන වරට මුදල් ගෙවා ඇති මාසය කවරේද;

(ii) මේ වනවිට ඔවුන්ට ගෙවා ඇති හිඟ මුදල ඒ ඒ දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප මට්ටමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0879/’10

11.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බණ්ඩාරගම දිස්ත්‍රික් රෝහලේ, බාහිර රෝගී අංශයේ,

(i) රෝගීන්ට රැඳී සිටීමට ස්ථානයක්;

(ii) රෝගීන් පරීක්ෂා කිරීමේ කාමර ප්‍රමාණවත් සංඛ්‍යාවක්;

(iii) ඖෂධාගාරය සඳහා නියමිත ස්ථානයක්;

(iv) එන්නත් ලබාදීම සඳහා විශේෂිත කාමරයක්;

(v) E.C.G. පරීක්ෂණය සිදුකිරීම සඳහා වෙන් කළ කාමරයක්;

(vi) රෝගීන්ට සහ කාර්ය මණ්ඩලයට වැසිකිළි පහසුකම්;

(vii) ක්‍රමවත් වූ හදිසි ප්‍රතිකාර ඒකකයක්;

(viii) විධිමත් රසායනාගාරයක්;

නොමැත්තේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත ප්‍රශ්න එකකට හෝ කිහිපයකට පිළිතුර “ ඔව්” නම්, එම අඩුපාඩු සම්පූර්ණ කිරීමට සඳහා කොපමණ කාලයකදී පියවර ගනු ලබන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0539/’10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නැගෙනහිර පළාතේ, බෝගහවැව - පුල්මුඩේ මාර්ගය සංවර්ධනය කිරීම සඳහා යෝජිත මාර්ගයක්ද;

(ii) එසේ නම්, එම මාර්ගය මේ වන විට සංවර්ධනය කරමින් පවතින්නේද;

යන්න එතුමා දන්වන්නෙහිද?

(ආ) මෙම මාර්ගයේ සංවර්ධන කටයුතු කරනු ලබන්නේ නම්,

(i) එහි දිග කිලෝමීටර් කොපමණද;

(ii) එහි වැඩ අවසන් කිරීමට යෝජිත දිනය කවරේද;

(iii) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබුවේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) ඒ ඒ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් මිල ගණන් කවරේද;

(iv) ටෙන්ඩරය පිරිනමන ලද ආයතනය හා අදාළ ටෙන්ඩර් මුදල කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මෙම මාර්ගය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල දේශීය අරමුදල්වලින් ලබා ගත්තේද;

(ii) නොඑසේ නම්, විදේශ ආධාර මගින් ලබා ගත්තේද;

(iii) විදේශ ආධාර ලබා ගත්තේ නම්, ආධාර ලබාදුන් රටේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0598/'10

13.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිරි වර්ෂ 8 සඳහා ප්‍රක්ෂේපිත දළ දේශීය නිෂ්පාදිතය (GDP) කොපමණද;

(ii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

(iii) මේ දක්වා වූ පසුගිය වර්ෂ අටක කාලය තුළ ඒක පුද්ගල ණය ප්‍රමාණය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) 1994/01/01, 2005/01/01 සහ 2010/08/01 යන දිනවලට ඒක පුද්ගල ඉපැයීම හා ණයවල අගයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

සමාජ සේවා අමාත්‍යතුමා,— මැතිවරණ (විශේෂ විධිවිධාන),— මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා යම් තැනැත්තකු විසින් යම් අශක්නුතාවයකට පත් ඡන්දදායකයකුව කැටුව යාමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම පිණිස ද; (262 වන අධිකාරය වූ) පළාත් පාලන මැතිවරණ ආඥාපනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1981 අංක 7 දරන ජනමත විචාරණ පනත, 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනත සහ 1988 අංක 2 දරන පළාත් සභා මැතිවරණ පනත සංශෝධනය කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි.

### යෝජනා පිළිබඳ දැනුම්දීම

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.00 දක්වා විය යුතුය. අ. භා. 7.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

3.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මෛත්‍රීපාල සේනානායක පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු හුනෛයිස් ෆාරූක් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රණ කලා ආයතනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"හෙළ උදාව ජාතික ව්‍යාපාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 නොවැම්බර් 22 දිනැති, අංක 1681/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1985 අංක 48 දරන පනතින් සහ 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 14 වැනි වගන්තිය සහ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2010 දෙසැම්බර් 24 දිනැති, අංක 1685/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.20 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*3.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2011 ජනවාරි මස 04) [1]

7.

මහේෂ්වරී පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

8.

ශ්‍රී ලංකාවේ සැමට සෙත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

9.

පින සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.